# මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතට කාරකසභා අවස්ථාවල යෝජිත සංශෝධන

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2023 ඔක්තෝබර්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතට සිය අවධානය යොමු කළ අතර පනත් කෙටුම්පතෙහි ඇතැම් වගන්ති ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් කළේය. 2023 ඔක්තෝබර් 18 දින, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි ව්‍යවස්ථානුකූලභාවය විමසීමේ නඩු විභාගය අතරවාරයේදී ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට තිබූ පනත් කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී රජය යෝජනා කර තිබූ සංශෝධන මාලාවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලදී. මෙම "කමිටු අවස්ථාවල සංශෝධන" මගින් ගැසට් පත්‍රයේ පළ කර ඇති පනත් කෙටුම්පතේ සාරානුකූල වෙනස්කම් සිදුකර ඇත. සංශෝධන කිහිපයක්ම කලින් ගැසට් කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි ශක්‍යතා හා මූලිකාංග වලින් බැහැර කර ඇති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (3) ව්‍යවස්ථාවට ද පටහැනි වේ. එවැනි සාරානුකූල වෙනස්කිරීම් මත රජය දැනට යෝජනා කර ඇති පනත් කෙටුම්පත ඉල්ලා අස්කරගත යුතු අතර සංශෝධිත අනුවාදය නැවත ගැසට් පත්‍රයේ පළ කළ යුතු වේ. ඒ අතර වඩාත් වැදගත් වෙනස්කම් පහත පරිදි සාරාංශ ගත කර දක්වනු ලැබේ.

1). <u>"සිද්ධියක් පිළිබඳව ඇතැම් ප්‍රකාශ" ඉවත් කිරීම</u>

මුලින් ගැසට් කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි "සිද්ධියක් පිළිබඳව ඇතැම් ප්‍රකාශ"යන නොපැහැදිළි පාරිභාෂික පද පෙළ දක්වා තිබිණි. දැන් ඊට "තහනම් ප්‍රකාශ" යන පාරිභාෂික පදය ආදේශ කර කෙටුම්පතේ III වැනි කොටසේ දක්වා ඇති වැරදි යටතේ අර්ථ දක්වා තිබේ. නිදසුනක් ලෙස මෙම වෙනස්කම මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ මුල් පනත් කෙටුම්පතේ පූර්විකාවේ හා යෝජිත සංශෝධනය අතර දැකිය හැකි වේ.

| මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි පූර්විකාව | යෝජිත සංශෝධනය |
| --- | --- |
| "මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද; ශ්‍රී ලංකාව තුළ සිද්ධියක් පිළිබඳව ඇතැම් ප්‍රකාශ මාර්ගගත ලෙස සන්නිවේදනය කිරීම තහනම් කිරීම....පිණිස ද වූ පනතකි." | "අන්තර්ජාලය හරහා සිදුකරන ලද තහනම් ප්‍රකාශ සඳහා ආරක්ෂාව සැපයීමට මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා වූ පනතකි." |

විශේෂයෙන්ම, මෙම වෙනස්කම පනත් කෙටුම්පතෙහි දිගු නාමය, 3 වන වගන්තිය, 11 (ආ) වගන්තිය හා හතර වන කොටසේ ශීර්ෂයේ ද දැකගත හැකි වේ.

2). පනත් කෙටුම්පතෙහි අරමුණු වෙනස් කිරීම

ප්‍රශ්නසහගත ලෙස, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ මුල් පනත් කෙටුම්පතේ තුන්වැනි වගන්තිය තර්ජනාත්මක, බියගන්වනසුලු හෝ පීඩාකාරී විය හැකි ප්‍රකාශවලින් පුද්ගලයන් ආරක්ෂා කිරීම අරමුණු කර තිබිණි.. සංකල්පීය අවිනිශ්චිතභාවය හේතුවෙන් එවැනි අපහැදිළි පාරිභාෂික පදවල අර්ථය රජය විසින් අත්තනෝමතික ලෙස භාවිත කිරීමට ඉඩ තිබිණි. වර්තමාන සංශෝධනයෙන් මෙම පාරිභාෂික වචන ඉවත් කර ඇති අතර "තහනම් ප්‍රකාශ සන්නිවේදනයෙන් සිදුවන හානියෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීම" යනුවෙන් ඊට නව පරමාර්ථ වගන්තියක් ආදේශ කර ඇත. ඒ අනුව, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ මුල් අරමුණ සංශෝධනය මගින් සාරානුකූලව වෙනස් කර ඇති අතර නව සංශෝධනයේ ද පුළුල් හා අපැහැදිළි අරුත් දෙන "හානිය" යන පාරිභාෂික පදය එසේම තබා තිබේ. නිදසුනක් ලෙස, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අරමුණුවල පුළුල්භාවය හේතුවෙන් රජය විසින් 2021 අංක 01 දරන ත්‍රස්තවාදය වැළක්වීමේ (දැඩි අන්තවාදී ආගමික මතවාද දැරීමෙන් මුදවා ගැනීමේ) නියෝග සාධාරණීකරණය කිරීමට උත්සහ කිරීම පෙන්වා දිය හැකි ය. පනත් කෙටුම්පත අන්තර්ජාලය හරහා සිදුවන හානිවලින් මහජනයා ආරක්ෂා කිරීමේ මුවාවෙන් ඉදිරිපත් කර ඇති නමුත් එමගින් මහජනයා කෙරෙහි රාජ්‍ය තර්ජනය මුවහත් කර ඇති බව විද්‍යමාන වේ.

3). කොමිෂන් සභා සාමාජිකයන් පත්කිරීම හා ඉවත්කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පැවරීම

මීට පෙර, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 5 වන වගන්තියට අනුව ජනාධිපතිවරයා විසින් තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා හා පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද හා සුදුසුකම් සම්පූර්ණ කර ඇති සාමාජිකයන් පස් දෙනෙකු මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමට පත් කිරීමට ප්‍රතිපාදන සකස් කර තිබිණ. එසේම, කොමිසමේ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිගැනීම හා සාමාජිකයන් ඉවත්කිරීමේ අනන්‍ය බලය ජනාධිපතිවරයා සතු විය. ඊට අමතරව, කොමිසමේ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිගැනීම හා සාමාජිකයන් ඉවත්කිරීමේ තනි හා අනන්‍ය බලය ද ජනාධිපතිවරයා සතු විය. කෙසේවෙතත්, දැනට යෝජිත සංශෝධනය අනුව මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමේ සාමාජිකයන් පත්කිරීම හා ඉවත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් සිදුකිරීමට යෝජනා කර තිබේ.

| මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 5 වැනි වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|
| තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා හා පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන්, කොමිෂන් සභාව සමන්විත විය යුතුය. | "(1). කොමිෂන් සභාව තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා හා පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් සුදුසුකම් හා පළපුද්ද සහිත, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.<br>(2). 6 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් සාමාජිකයන් ලෙස පත්කළ යුතු පස් දෙනෙකුගේ නම් 1 වැනි උපවගන්තිය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ කරනු ලැබිය යුතුය.<br><br>(3). ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලැබී දින 14ක් තුළ එසේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලද පුද්ගලයන් 2 වැනි උපවගන්තියට අනුව කොමිසමේ සාමාජිකයන් ලෙස පත්කරනු ලැබිය යුතුය.<br><br>(4). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 2 වැනි උපවගන්තියට අනුව යොමු කරන ලද තැනැත්තෙකුගේ නාමයක් ප්‍රත්ක්ෂේප කළවිට, ජනාධිපතිවරයා විසින් නව නාමයක් යෝජනා කළ යුතු අතර එවැනි නාමයෝජනාවක් සඳහා 1, 2 හා 3 උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතුය.<br><br>(5). 3 වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දින 14ක කාල පරිච්ඡේදය ඇතුළත අවශ්‍ය පත්කිරීම් සිදුකිරීමට ජනාධිපතිවරයා |

| මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 7 (2) වැනි වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|
| ජනාධිපතිවරයා විසින්, ඒ සඳහා හේතු දක්වා, කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ස්වකීය ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. | අදාළ සමාජිකයාට අදාළව කරුණු විමසීමෙන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ එම සාමාජිකයා<br><br>(අ). තම ධුරයේ බලතල හා කාර්යයන් ඉටුකිරීමට, ක්‍රියාත්මක කිරීමට, තවදුරටත් කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවයකට මාස තුනක කාලයක සිට පත්ව ඇත්නම්;<br><br>(ආ). කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව මාස තුනකට වැඩි කාලයක් තම ධුරයේ බලතල හා කාර්යයන් ඉටුකිරීමට, ක්‍රියාත්මක කිරීමට, තවදුරටත් කරගෙන යාමට අපොහොසත් වීම; හෝ<br><br>(ඇ). 6 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව නුසුදුස්සෙක් වීම. |

4). <u>ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාපටිපාටිය වෙනස් කිරීම</u>

ගැසට් කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 9 (5) වගන්තියට අනුව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු සියලු කරුණු කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුව තිබිණි. ඒ වෙනුවට, දැනට යෝජිත සංශෝධනයේ "තීරණය ගනු ලබන රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීම" අනුව මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් සියලු තීරණවලට එළඹෙන බව දක්වා තිබේ. ඒ අනුව, තාක්ෂණික වශයෙන්, එවැනි තීරණයකට සහාය පළ කරන කොමිසමේ සාමාජිකයන් දෙදෙනෙකුට පමණක් වුවද තීරණ ගැනීමට හැකි වේ.

5). මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමේ බලතල පුළුල් කිරීම

සංශෝධිත 11 (ඌ) වගන්තිය මගින් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 11 (එ) වගන්තියට එක් කර ඇති සංශෝධනය, 'තහනම් ප්‍රකාශ' සම්බන්ධයෙන් නියාමක කාර්යයේ සිට ස්වාධීන විමර්ශන ආයතනයක් දක්වා කොමිසමේ කාර්යභාරය පුළුල්වීමේ අවධානම ඇති කර තිබේ.

| මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 11 (එ) වැනි වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|
| "යම් අධිකරණයක් විසින් විධානය කරනු ලැබීම මත, යම් විමර්ශන සිදුකිරීම සහ යම් සේවාවන් සැපයීම". | "එවැනි පරීක්ෂණ සිදුකිරීම හා කොමිසමේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීමේදී අවශ්‍ය සේවාවන් සැපයීම". |

ගැසට් කරන ලද පනත් කෙටුම්පතින් විමර්ශන කටයුතුවලදී මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසම යම් අධිකරණමය පාලනයක්ට යටත් කර තිබිණි. යෝජිත සංශෝධනය මගින් කොමිසමට ස්වාධීන විමර්ශන බලතල ලබා දී ඇති අතර මුල් පනත් කෙටුම්පතින් යෝජනා කර තිබූ අධිකරණමය පාලනය ඉවත් කර තිබේ.

නිශ්චිතවම, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමේ බලය ක්‍රම රටාවක් ලෙස පුළුල් කිරීම පනත් කෙටුම්පතට යෝජිත සංශෝධනයේ 26 (9) වගන්තියේ පැහැදිළිව දක්නට ලැබේ. යම් තැනැත්තෙකු හෝ අන්තර්ජාල අතරමැදියෙකු මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසම විසින් නිකුත් කරන ලද දැන්වීමකට අනුකූල නොවුවහොත් කොමිසමට "පෙත්සමක් හා දිවුරුම් පත්සමක් මාර්ගයෙන් එම දැන්වීමට අනුකූලව ක්‍රියාකරන ලෙස නියෝගයක් මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගැනීමට හැකි වේ".

මේ හා සමාන ආකාරයෙන්ම, පනත් කෙටුම්පතේ 31 (3) වගන්තියට අනුව කොමිසම විසින් නිකුත් කරන ලද "රීති සංග්‍රහයට" අනුව ක්‍රියාකිරීමට යම් තැනැත්තෙකු අපොහොසත් වන විට හා එහි ප්‍රතිඵලයක් ලෙස "වෙනත් ඕනෑම තැනැත්තෙකුට අයුතු අලාභයක් සිදුකරන තැනැත්තා විසින් අයුතු අලාභ ලැබූ තැනැත්තාට වන්දි වශයෙන් අලාභය ගෙවීමට බැඳී සිටී". ඒ අනුව, මාර්ගගත භාවිතයන් සඳහා නීති පැනවීමට මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමට හැකි බව පෙනී යයි.

ඒ අනුව, මුලින් ගැසට් කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතින් කොමිසමට ලබා දී තිබූ අත්තනෝමතික අභිමතානුසාරී බලය අවම කිරීම වෙනුවට මෙම සංශෝධන මගින් කොමිසමේ බලතල තවදුරටත් පුළුල් කර ඇති බව පෙනේ.

6). තහනම් ප්‍රකාශ සන්නිවේදනය සඳහා වූ දඬුවම් වෙනස් කිරීම

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ III වන කොටසේ තහනම් ප්‍රකාශවලට බොහෝමයකට අදාළ විවිධ වැරදි දක්වා ඇති අතර එක් එක් වරද සඳහා අනුයාත දඬුවම් ද දක්වා තිබේ. කෙටුම්පතට යෝජනා කර ඇති සංශෝධන මගින් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කෙටුම්පත යටතේ දක්වා ඇති වැරදිවලට අදාළ දඬුවම් පහත දැක්වෙන පරිදි පුළුල් වෙනස්කම්වලට ලක්කර තිබේ.

| වගන්තිය | ගැසට් කරන ලද පනත් කෙටුම්පතේ දක්වා ඇති දඬුවම | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 12 | "....වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට යටත් විය යුතු අතර...." | "හෝ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩ මුදලක්" ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |
| 14 (අ) | "....අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරග ත්කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතුය." | "හෝ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩ මුදලක් හෝ ඒ දඬුවම් දෙකම" ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |
| 14 (ආ) | "....අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතුය." | "රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩ මුදලක් හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම" ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |
| 17 | "....වසර තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරග ත්කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතු අතර ...." | "හෝ රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩ මුදලක් හෝ ඒ දඬුවම් දෙකම" ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |
| 18 | "....වසර එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරග ත්කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතු අතර...." | "....වසර හතක් දක්වා දීර්ඝ කළ හැකි කාල සීමාවකට හෝ රුපියල් ලක්ෂ හත නොඉක්මවන දඩයක්...."ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |
| 19 | "....වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරග ත්කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතු අතර...." | "....වසර තුනක් දක්වා දීර්ඝ කළ හැකි කාල සීමාවකට හෝ රුපියල් ලක්ෂ තුන නොඉක්මවන දඩයක්...."ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |

| | | |
|---|---|---|
| 21 | "....වසර හතරක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරග ත්කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතු අතර...." | "රුපියල් ලක්ෂ හතකට නොවැඩි දඩ මුදලක් හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම" ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |
| 23 | "....වසර විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතු අතර...." | "....අවුරුදු දෙකට නොඅඩු අවුරුදු විස්සට නොවැඩි කාල සීමාවක් දක්වා බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් ලක්ෂ දහයක් නොඉක්මවන දඩයක්...." ලබා දී ඇති දඬුවමට එකතු කිරීම. |

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ දක්වා ඇති මෙම වැරදි, මර්ගගත ක්‍රම හරහා සිදුකරනු ලබන ක්‍රියාවන්ට අදාළ වැරදි හැර, දණ්ඩ නීති සංග්‍රහයේ දැනට තිබෙන ප්‍රතිපාදනවලට සමාන වේ. කෙසේවෙතත්, පනත් කෙටුම්පතේ නිශ්චිතව දක්වා ඇති දඬුවම් දණ්ඩ නීති සංග්‍රහයේ ඊට අදාළ අනුරූප දඬුවම්වලට වඩා බැරෑරුම් බව පෙනී යයි. ඊට අමතරව, ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම අපරාධමය වරදක් ලෙස දැක්වූ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 16 වැනි වගන්තිය දැන් ඉන් ඉවත් කර තිබේ.

7). <u>අමාත්‍යවරයාගේ අභිමතානුසාරී බලය පුළුල් කිරීම</u>

පනත් කෙටුම්පතේ 37 (1) වගන්තියට විශේෂ සංශෝධනයක් යෝජනා කර තිබේ. ගැසට් කරන ලද පනත් කෙටුම්පතින් අධිකරණය විසින් අවශ්‍ය යැයි සළකනු ලබන අවස්ථාවක දී පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසම පවත්වනු ලබන යම් විමර්ශනයකදී " විශේෂඥවරු" පත්කිරීමට අමාත්‍යවරයාට බලය පවරා ඇත. කෙසේවෙතත්, වර්තමාන සංශෝධනය මගින් මුල් කෙටුම්පතින් සපයා තිබූ මෙම අධිකරණමය ආරක්ෂණය ඉවත් කර ඇති අතර ඒ අනුව අධිකරණයේ පූර්ව අනුමැතියකින් තොරව විශේෂඥයින් පත්කිරීමට අමාත්‍යවරයාට ඉඩ ලබා දී ඇතඃ

| මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 37 (1) වැනි වගන්ති | යෝජිත සංශෝධනය |
|---|---|
| "අධිකරණය විසින් අවශ්‍ය යැයි සළකනු ලබන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් , ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන යම් විමර්ශනයකදී යම් පොලිස් නිළධරයෙකුට සහාය වීම සඳහා (මෙහි මින් මතු "විශේෂඥයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් නිශ්චිත්ව දක්වනු ලබන සුදුසුකම් හා පළපුරුද්ද ඇති තැනැත්තෙකු, ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකිය". | "අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්....යම් තැනැත්තෙක්, ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක් පත් කළ හැකි ය." |

8). <u>අපරාධ නඩු කටයුතු පවරා පවත්වාගෙන යාමට කොමිසමට ඇති හැකියාව</u>

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කෙටුම්පතේ 42 වැනි වගන්තිය ඕනෑම පුරවැසියෙකුට එරෙහිව සෘජුව අපරාධ නඩු පැවරීමට කොමිසමට හැකිවන ආකාරයට සංශෝධනය වනු ඇත. මෙය මුලින් ගැසට් කරන ලද පනත් කෙටුම්පතින් ලබාදී තිබූ බලතල ප්‍රමාණයෙන් කොමිසම බැහැර කිරීමකි. ඊට අමතර, සංශෝධිත 42 (1) වගන්තිය ව්‍යාකුල හා එකිනෙක බැඳුණු ලෙස සංග්‍රහගත කර තිබේ

| මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ 42 වැනි වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|
| "මේ පනතේ ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති පරිදි හැර, මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන විමර්ශන, නඩු විභාග සහ එවැනි යම් නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරනු ලබන නඩු තීන්දු, දණ්ඩන නියම සහ ආඥාවන් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කර ගනු ලැබිය යුතු ය." | "(1). මේ පනතේ ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති පරිදි හැර, මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන විමර්ශන, නඩු පැවරීම, නඩු විභාග සහ එවැනි යම් නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරනු ලබන නඩු තීන්දු, දණ්ඩන නියම සහ ආඥාවන් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කර ගනු ලැබිය යුතු ය.<br><br>(2). මෙම පනත යටතේ පවත්වනු ලබන විමර්ශන අතරතුර අනාවරණය වූ දෙයක් මත ඕනෑම තැනැත්තෙක් මෙම පනතේ විධිවිධාන යටතේ සංයුක්ත වන වරදක් කර ඇතැයි කොමිසම අදහස් කරන්නේ නම් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136 වගන්තිය යටතේ අපරාධ නඩුවක් පැවරීමට පියවර ගනු ලැබිය යුතුය." |

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org